සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 ශ්‍රේණිය

## විද්‍යාව

**නම / විභාග අංකය :-..........................................................** **කාලය: පැය 02 යි**

1 පත්‍රය

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පෘථිවියේ පවතින පරිභෝජනයට ගත හැකි ජල ප්‍රතිශතය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) 0.1% (2) 0.01% (3) 0.001% (4) 70%

02. ශාක ආහාර නිපදවීමේ දී වායුගෝලයෙන් ලබා ගන්නා වායුව කුමක් ද?
(1) ඔක්සිජන් (2) නයිට්‍රජන් (3) හයිඩ්‍රජන් (4) කාබන්ඩයොක්සයිඩ්

03. ශාක තුළ පමණක් සිදුවන ජීව ක්‍රියාවලිය වන්නේ,
(1) චලනය (2) ප්‍රජනනය (3) වර්ධනය (4) ප්‍රභාසංස්ලේෂණය

04. පිළිවෙලින් තත්, පටල, වායු කඳක් කම්පනය වන උපකරණ අඩංගු නිවැරදි පිළිතුරු වන්නේ,
(1) වයලීනය, තම්මැට්ටම, සර්පිනාව (2) ගිටාරය, බෙරය, උඩැක්කිය
(3) වීනාව, නළාව, උඩැක්කිය (4) වයලීනය, රබාන, තම්මැට්ටම

05. දීප්ත වස්තු පමණක් අඩංගු පිළිතුරු තෝරන්න.
(1) සූර්යයා, කණාමැදිරියා (2) සූර්යයා, රැබදුල්ලාගේ එළිය
(3) චන්ද්‍රයා, ආලෝකය විහිදුවන හතු (4) ග්‍රහලෝක, රැබදුල්ලා

06. මුහුදු ජලයේ වැඩිපුරම අඩංගු ලවණය කුමක් ද?
(1) කැල්සියම් කාබනේට් (2) සෝඩියම් කාබනේට්
(3) සෝඩියම් ක්ලෝරයිඩ් (4) කැල්සියම් ක්ලෝරයිඩ්

07. ස්කන්ධයක් රහිත, අවකාශයේ ඉඩක් අත්කර නොගන්නා ද්‍රව්‍ය,
(1) ඝන ද්‍රව්‍ය වේ. (2) ශක්ති වේ. (3) වායු වේ. (4) පාදාර්ථ වේ.

08. දඬු ආකාර P, Q, R ද්‍රව්‍ය තුනක එක් අග්‍රයක් චුම්බකයක N හා S ධ්‍රැව අසලව ළංකල විට නිරීක්ෂණය කළ දේ පහත වගුවේ දැක්වේ.




| ද්‍රව්‍ය | N අග්‍රය වෙතට | S අග්‍රය වෙතට |
|---|---|---|
| P | ආකර්ෂණය වේ. | විකර්ෂණය වේ. |
| Q | ආකර්ෂණය වේ. | ආකර්ෂණය වේ. |
| R | ආකර්ෂණය හෝ විකර්ෂණ නොවේ. | ආකර්ෂණය හෝ විකර්ෂණ නොවේ. |

P, Q, R විය හැක්කේ පිළිවෙලින්,
(1) චුම්බකය, යකඩ ඇණය, කාබන් කූර (2) චුම්බකය, කාබන් කූර, යකඩ ඇණය
(3) යකඩ ඇණය, කාබන් කූර, චුම්බකය (4) කාබන් කූර, යකඩ ඇණය, චුම්බකය

09. ෆොසිල ඉන්ධන සම්බන්ධ **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) පොළොව අභ්‍යන්තරයෙන් ලබා ගනී. (2) ජෛව ස්කන්ධ දහනය වීමෙන් හටගනී.
(3) ඒවායේ සූර්යයාගේ ශක්තිය අන්තර්ගත වී ඇත (4) දිනෙන් දින ක්ෂය වෙමින් පවතී.

10. භාවිතයෙන් ඉවත් කළ CFL බල්බ පරිසරයට එකතු වීම අහිතර කර වීමට වඩාත්ම බලපාන හේතුව වන්නේ,
   (1) එහි වීදුරු අන්තර්ගත වීමයි.
   (2) ඒවායේ අහිතකර වායු අන්තර්ගත වීමයි.
   (3) ඒවායේ රසදිය අන්තර්ගත වීමයි.
   (4) එහි පීනෝල හා නැප්තලීන් වැනි සංයෝග අන්තර්ගත වීමයි.


11. ආලෝකය මත වෙනස් වන ප්‍රතිරෝධකයක් ඇති උපකරණයක සම්මත සංකේතය මින් කුමක් ද?

(1)  (2)  (3)  (4) 

12. විදුලි අනතුරු වැලකීම සඳහා ගෘහ විද්‍යුත් පරිපථයක අනිවාර්යයෙන්ම තිබිය යුතු උපාංගය වන්නේ,
   (1) ප්‍රධාන ස්විචය (2) විදුලි මීටරය (3) පැන්නුම් ස්විචය (4) භූගත කම්බිය

13. ද්‍රව → ඝන අවස්ථා විපර්යාසය සඳහා උදාහරණයක් වන්නේ,
   (1) තුෂාර ඇතිවීම (2) යකඩ ද්‍රව වීම (3) අයිස්කැට දියවීම (4) අයිස්කැට සෑදීම

14. ආහාර දාම සම්බන්ධව සත්‍ය ප්‍රකාශය තෝරන්න.
   (1) සෑම ආහාර දාමයක්ම ශාක භක්ෂකයකුගෙන් ආරම්භ වේ.
   (2) ආහාර දාමයක් පුරුක් තුනකින් යුක්ත වේ.
   (3) පරිසරයේ සමතුලිත බව සඳහා සෑම පුරුකක්ම ආධාර වේ.
   (4) ආහාර දාමයක දෙවන පුරුක මාංශ භක්ෂකයකු වේ.



15. රූපයේ දැක්වෙන උපකරණය හා එහි කාර්යය දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
   (1) සුළං දිශා දර්ශකය - සුළගේ දිශාව මැනීම. (2) අනිල මානය - සුළගේ වේගය මැනීම.
   (3) ආර්ද්‍රතා මානය - ආර්ද්‍රතාවය මැනීම (4) වර්ෂා මානය - වර්ෂාපතනය මැනීම.

16. විදුලි පරිපථයක් තුළින් විදුලි ධාරාවක් එක් දිශාවකට පමණක් ගමන් කිරීමට සලසන උපාංගය වන්නේ,
   (1) ඩයෝඩය (2) ධාරිත්‍රකය (3) ස්විචය (4) ආලෝක සංවේදී ප්‍රතිරෝධක

17. භංගුර, ආහන්‍ය සහ තන්‍ය යන ලක්ෂණ සහිත ද්‍රව්‍ය පිළිවලින් අඩංගු පිළිතුර තෝරන්න.
   (1) වීදුරු, යකඩ, රබර් (2) වීදුරු, රත්රන්, ප්ලාස්ටික්
   (3) අඟුරු, රබර්, තඹ (4) අඟුරු, තඹ, ඇලුමිනියම්

18. එන්ජිමක් මගින් ඩයිනමෝවක් කරකවා විදුලිය ලබාගන්නා විදුලි බලාගාරය වන්නේ,
   (1) කැළණිතිස්ස (2) රන්ටැඹේ (3) නොරොච්චෝලය (4) වික්ටෝරියා


19. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ශාකවල වර්ධනය යම් කාලයකට පසු නවතී.
   (2) හරිතප්‍රද වර්ණකය නැති වුවත් සතුන් ආහාර නිෂ්පාදනය කරයි.
   (3) සතුන්ගේ වර්ධනය ජීවිත කාලය පුරාම සිදු වේ.
   (4) දෙබෙදුම් සූචි වල දී යම් ලක්ෂණයක් ඇති නැති බව අනුව වර්ග කරයි.

20. නාය යෑම් හා සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,
   (1) ලංකාවේ වැඩිපුර සිදුවන්නේ නුවරඑළිය, රත්නපුර ප්‍රදේශවලයි.
   (2) ඉහළින් පිහිටි පස්, ගල්, ගස් වැලි පහළ ප්‍රදේශයකට ලිස්සා යාමක් මෙහි දී සිදු වේ.
   (3) නායයෑම් සඳහා පෘථිවියේ ගුරුත්ව බලය හේතු නොවේ.
   (4) කඳු බෑවුම් නාය යෑම් වලට මිනිසාගේ අයපත් ක්‍රියාවන් වැඩිපුර හේතු වේ.

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සයන්න.**

01. (A) 6 ශ්‍රේණියේ සිසුන් කිහිප දෙනෙකු අඹ ගසක් ආශ්‍රිතව දින කීපයක් නිරීක්ෂණය කරන ලද තොරතුරු මගින් ලබාගත් ආහාර සම්බන්ධතාවයක් පහත දක්වා ඇත.




(i) මෙම ආහාර සම්බන්ධතාව කුමන නමකින් හඳුන්වයි ද?

.................................................................................................................................................

(ii) මෙහි සිටින ස්වයං පෝෂිතයෙක් නම් කරන්න.

.................................................................................................................................................

(iii) X හා Y සඳහා සුදුසු ජීවින් **දෙදෙනෙකු** නම් කරන්න.

X ........................................................ Y ............................................................

(iv) ආහාර දාමයක් යනු කුමක් ද?

.................................................................................................................................................

(v) ඉහත සටහනින් පුරුක් 3 ක ආහාර දාමයක් තෝරා ලියන්න.

.................................................................................................................................................

(vi) ඉහත ජීවින් අතුරින් ශාක භක්ෂක ජීවියකු හා මාංශ භක්ෂක ජීවියකු ලියන්න.

මාංශ භක්ෂක- ..................................................... ශාක භක්ෂක- .....................................................

(B) පියවි ඇසට නොපෙනෙන ඉතා කුඩා ජීවින් ක්ෂුද්‍ර ජීවීන් ලෙස හඳුන්වයි. මොවුන් මිනිසාට හිතකර මෙන්ම අහිතකර වන අවස්ථා ද ඇත.

(i) ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණයට විද්‍යාගාරයේ භාවිත කරන උපකරණය සඳහන් කරන්න.

..............................................................

(ii) ක්ෂුද්‍ර ජීවීන් මිනිසාට හිතකර වන අවස්ථාවක් සඳහන් කරන්න.

.................................................................................................................................................

(iii) ක්ෂුද්‍ර ජීවීන්ගෙන් මිනිසාට වන හානි **දෙකක්** සඳහන් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

(iv) මෙම දිනවල පවතින වසංගත රෝග තත්වයට හේතු වී ඇති ක්ෂුද්‍ර ජීවී වර්ගය නම් කරන්න.


........................................................................

(v) එම ක්ෂුද්‍ර ජීවීන් ශරීරගත වීම වැලැක්වීමට ඔබ අනුගමනය කරන සෞඛ්‍යය පුරුදු **දෙකක්** සඳහන් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

02. (A) පහත A රූපයේ දැක්වෙන්නේ හඳුන්කූරක් දල්වා යටිකුරු කරන ලද වායු සරාවට එහි දුම ඇතුළු කර ඇති ආකාරයයි. ඉන්පසුව එම ප්‍රමාණයේම තවත් හිස් වායු සරාවක් ගෙන එම වායු සරාවේ කටට සමව සිටින සේ තබන ආකාරය B රූපයේ දැක්වේ.




A රූපය B රූපය

(i) B රූපයේ පරිදි ඇටවුම සකස්කර ටික වේලාවකට පසු නිරීක්ෂණය සඳහන් කරන්න.

........................................................................................................................................

(i) මෙම නිරීක්ෂණයෙන් එළඹිය හැකි නිගමනය කුමක් ද?

........................................................................................................................................


(ii) ඉහත සඳහන් වූ භෞතික ගුණයට අමතරව වායුවක් සතු වෙනත් භෞතික ගුණයක් සඳහන් කරන්න.

..............................................................................................

(iii) අපගේ වායු ගෝලයේ අඩංගු වායු වර්ග දෙකක් ලියන්න.

....................................... .......................................

(B) එක්තරා ආයතනයක් වෙත පැමිණි පුද්ගලයින්ගේ ශරීර උෂ්ණත්වය මැනීම සිදු කර වර්තා තබා ගන්නා ලදි. එම වාර්තා ඇසුරින් අඳින ලද ප්‍රස්තාරයක් පහත දැක්වේ.




(i) ප්‍රස්තාරයට අනුව වාර්තාවන වැඩිම ශරීර උෂ්ණත්වය කොපමණ ද?

..............................................................................................

(ii) එම උෂ්ණත්වය සහිත පුද්ගලයින් සංඛ්‍යාව කොපමණ ද?

..............................................................................................

(iii) ප්‍රස්ථාරයට අනුව මෙම ආයතනයට පැමිණි පුද්ගළයින්ගේ සාමාන්‍ය ශරීර උෂ්ණත්වය සඳහන් කරන්න.

..............................................................................................

(iv) මෙහි සඳහන් ඒකකය හැර ශරීර උෂ්ණත්වය මැනීමට යොදාගන්නා වෙනත් ඒකකයක් ලියන්න.

..............................................................................................

03. (A) ජලය ස්වභාවික හා සීමිත සම්පතක් ලෙස අපට ප්‍රයෝජනවත් වේ. පහත දැක්වෙන සංකල්ප සිතියම ජලය ආශ්‍රිතව ගොඩ නගන ලද්දකි. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) 1. මිරිදිය
2. ..........................
3. ..........................
ලවණතාව අනුව වෙන් කරයි.

(ii) 1. ඝන
2. ..........................
3. ..........................
භෞතික අවස්ථාව අනුව වර්ග කරයි.

ජලය

(iii) 1. ..........................
2. ..........................
3. ..........................
පවතින ආකාරය අනුව කොටස් 3 කි.

ප්‍රයෝජනවත් වන අවස්ථා වේ.

(iv) 1. ..................................................
2. ..................................................

ජීවීන්ගේ පරිභෝජනයට නුසුදුසු මට්ටමට ජලයට ද්‍රව්‍ය එක්වීම

(v) ..........................

එය සිදුවන ප්‍රධාන ක්‍රම දෙකකි.

(vi) 1. ..........................
2. ..........................

(B) සමහර රටවල උදම් රළ මගින් ක්‍රියාත්මක විදුලි බලාගාර මගින් ද විදුලි අවශ්‍යතා සම්පූර්ණ කර ගනී.

(i) චන්ද්‍රයාගේ හා සූර්යයාගේ බලපෑම නිසා සාගර ජල මට්ටම් වෙනස්වීම හඳුන්වන නම කුමක් ද?

..........................................................................................

(ii) උදම් රළ විදුලි බලාගාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත ඔබ සඳහන් කළ ජල මට්ටම් අතර වෙනස කෙබඳු විය යුතු ද?

..........................................................................................


(iii) උදම් රළ බලාගාරයක් ක්‍රියාත්මක කිරීමේ දී ගොඩබිම ඇති ජලාශයකට මුහුදු ජලය ගලා යෑමට සලස්වයි. එය සිදුවන්නේ ඉහත (i) හි සඳහන් කළ කුමන අවස්ථාවේ දී ද?

..........................................................................................................................

(iv) මුහුදු රළ පහරේ අධික ශක්තියක් ඇත. එය සනාථ කිරීමට ඔබ දන්නා උදාහරණයක් සඳහන් කරන්න.

..........................................................................................................................

04. (A) විද්‍යාගාරයේ දී සකස් කරන ලද සරල කෝෂ ඇටවුමක රූප සටහනක් පහත රූපයේ දැක්වේ.



(i) x, y, z නම් කරන්න.

x................................................

................................................

z ................................................

(ii) බල්බය සම්බන්ධ කළ විට දැකිය හැකි නිරීක්ෂණය ලියන්න.

..........................................................................................


(iii) මෙම කෝෂයේ ඇති දුර්වලතාවයක් සඳහන් කරන්න.

..........................................................................................................................

(iv) පහත දැක්වෙන පරිපථයේ ස්විචය ක්‍රියාත්මක කළ විට නිරීක්ෂණය කළ හැකි කරුණු දෙකක් ලියන්න.

..........................................................................................................


..........................................................................................................




(B) රූපයේ දැක්වෙන පුඩුව සහිත කම්බි මුදුව සහ එහි විශ්කම්භයට ස්වල්පයක් විශාල විශ්කම්භයක් සහිත වීදුරු බෝලයක් ඔබට ලබා දී ඇත.

(i) කම්බි මුදුව තුළින් වීදුරු බෝලය පහසුවෙන් ඇතුලට යැවීම සඳහා ඔබට කළ හැකි කාර්යයක් ලියන්න.

ගෝලය



කම්බි පුඩුව

..........................................................................................................

(ii) ඔබ සිදුකළ කාර්යය නිසා වීදුරු බෝලය පහසුවෙන් කම්බි පුඩුව තුළින් ගමන් කිරීමට හේතුව විද්‍යාත්මකව පැහැදිළි කරන්න.

..........................................................................................................


..........................................................................................................

(iii) එදිනෙදා ජීවිතයේ දී මෙම සංසිද්ධිය දැකිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

05. (A) ගලායන ජලයෙන් විදුලිය නිපදවීමට සකසන ලද ඇටවුමක් පහත රූපයේ දැක්වේ.




(i) රූපයේ A, B, C කොටස් නම් කරන්න.

A ..................................................................

B ..................................................................

C ..................................................................

(ii) ගලා යන ජලය සතු කුමන ගුණය නිසා විදුලිය ජනනය වේ

..........................................................................................................

(iii) විදුලිය නිපදවීම හැර ගලා යන ජලයෙන් ගත හැකි වෙනත් ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

(B) ශාකවල ආහාර නිපදවීමටත් පෙනීම සඳහාත් ආලෝකය අත්‍යවශ්‍ය වේ.

(i) ආලෝකයෙන් අපට ඇති වෙනත් ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

(ii) ආලෝක කදම්බයක් යනු කුමක් ද?

..........................................................................................................

(iii) තමා විසින් ආලෝකය නිකුත් නොකරන වස්තු හඳුන්වන නම කුමක් ද?


..........................................................................................................

(iv) පාරදෘශ්‍ය හා පාරභාසක ද්‍රව්‍ය සඳහා උදාහරණ **එක බැගින්** සඳහන් කරන්න.

පාරදෘශ්‍ය ........................................................ පාරභාසක ........................................................

06. (A) කාන්දම් ලෙස ව්‍යවහාර කරන ද්‍රව්‍ය විද්‍යාත්මකව හඳුන්වනු ලබන්නේ චුම්බක ලෙසයි.

(i) චුම්බක සෑදීම සඳහා බහුලව යොදා ගන්නා ලෝහය කුමක් ද?




..........................................................................................

(ii) චුම්බකයක ආකර්ශන බල වැඩිම ප්‍රදේශ හඳුන්වන නම කුමක් ද?

..........................................................................................

(iii) රූපයේ දැක්වෙන්නේ චුම්භකයක් ලී ආධාරකයක එල්වා ඇති ආකාරයයි. චුම්බකයේ උත්තර ධ්‍රැවය හා දක්ෂිණ ධ්‍රැවයට අදාළ ඉංග්‍රීසි අක්ෂර සඳහන් කරන්න.

උත්තර ධ්‍රැවය ................................................................ දක්ෂිණ ධ්‍රැවය .................................................

(iv) චුම්බකයක් මත සුදු කඩදාසියක් තබා ඒ මත යකඩ කුඩු ඉස්ස විට යකඩ කුඩු පිහිටන ආකාරය පහත රූප සටහනේ ඇද පෙන්වන්න.



(v) චුම්බකයක් අවට බල පැතිරී ඇති ප්‍රදේශය හඳුන්වන නම කුමක් ද?

....................................................................

(B) සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(ධ්වනි ප්‍රභව, ඇසීම, කන, කම්පනය, ඝෝෂා)

(i) ශබ්දය හෙවත් ධ්වනිය නිපදවෙන්නේ යමක් .............................. වීමෙනි.

(ii) ශබ්දය නිපදවන වස්තු .................................... ලෙස හැඳින්වේ.

(iii) ශබ්දය සඳහා සංවේදී ඉන්ද්‍රියය ......................... වේ.

(iv) රිද්මයානුකූල නොවන අවිධිමත් ශබ්ද .............................. වේ.

(v) කනට හානි සිදු වුවහොත් ............................ දුර්වල වේ.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 ශ්‍රේණිය

## විද්‍යාව-පිළිතුරු

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 6 | 3 | 11 | 4 | 16 | 1 |
| 2 | 4 | 7 | 2 | 12 | 3 | 17 | 4 |
| 3 | 4 | 8 | 1 | 13 | 4 | 18 | 1 |
| 4 | 1 | 9 | 2 | 14 | 3 | 19 | 4 |
| 5 | 2 | 10 | 3 | 15 | 2 | 20 | 3 |

(ලකුණු 2×20=40)

### II පත්‍රය

01. (A) (i) ආහාර ජාලයක් 01

(ii) අඹ 01

(iii) x - පුසා y – උකුස්සා (වැනි ගැලපෙන පිළිතුරක්) 02

(iv) හරිත ශාකයකින් ආරම්භ වී අනුක්‍රමයෙන් සතුන් ඔස්සේ ශක්තිය ගලායන ආකාරය දාමයකින් දැක්වීම. 02

(v) නිවැරදි පුරුක් 03 ක ආහාර දාමයක් 02

(vii) නිවැරදි ජීවීන් දෙනෙකු දැක්වීම 01

(B) (i) සංයුක්ත අන්වීක්ෂය 01

(ii) මළ ද්‍රව්‍ය දිරාපත් කිරීම/ යෝගට්, කිරි නිපදවීම/ හම්පදම් කිරීම වැනි පිළිතුරු 02

(iii) ලෙඩ රෝග බෝවීම, ආහාර නරක්වීම, ඇදුම් පුස්කෑම වැනි නිවැරදි පිළිතුරු දෙකක් 01

(iv) වෛරස 01

(v) නිවැරදි සෞඛ්‍යය පුරුදු දෙකක් 02

<u>**මුලු ලකුණු 16**</u>

02. (A) (ii) 1 වායු සරාවේ ඇති හඳුන්කූරු දුම 2 වායු සරාව තුළට ද පැතිරී යයි. 02

(iii) වායුවකට නිශ්චිත පරිමාවක් නොමැති අතර අඩංගු බඳුන පුරා පැතිරී යයි. 02

(iv) නිශ්චිත හැඩයක් නැත. 01

(v) ඔක්සිජන්, නයිට්‍රජන්, හයිඩ්‍රජන්, කාබන්ඩයොක්සයිඩ්, ජලවාෂ්ප 02

(B) (i) 39°C 01

(ii) 4 01

(iii) 37°C 01

(iv) °F 01

<u>**මුලු ලකුණු 11**</u>

03. (A) (i) කරදිය, කිවුල් දිය

(ii) ද්‍රව, වායු

(iii) වර්ෂණය, මතුපිට ජලය, භූගත ජලය

(iv) සුදුසු අවස්ථා 02 ක්

(v) ජල දූෂණය

(vi) ඕනෑම ජල දූෂණය වන ක්‍රම දෙකක් (ලකුණු 1/2×12=06)

(B) (i) වඩදිය හා බාදිය 01

(ii) ජල මට්ටම් අතර වෙනස විශාල විය යුතුය. 02

(iii) වඩදිය ඇතිවන අවස්ථාවේ දී 01

(iv) වෙරළ ඛාදනය/ සුනාමි අනතුරින් දේපළ හා ජීවිත විනාශ වීම හෝ
පිළිගත හැකි වෙනත් නිවැරදි පිළිතුරක් 01

<u>**මුළු ලකුණු 11**</u>

04. (A) (i) x – කොපර් තහඩුව

y – සින්ක් තහඩුව

z – තනුක සල්ෆියුරික් අම්ලය 03

(ii) බල්බය සම්බන්ධ කර ටික වේලාවකට පසු නිවී යයි. 01

(iii) දිගු වේලාවක් විදුලිය ලබා ගත නොහැකි වීම. 01

(iv) බල්බය දැල්වීම, (A) හි කටුව උත්ක්‍රමණය වීම. 02

(B) (i) කම්බි මුදුව පමණක් දැල්ලට අල්ලා රත් කිරීම. 01

(ii) ඝන ද්‍රව්‍ය ප්‍රසාරණය වන බව 01

(iii) රේල් පිලී අතර හිඩැසක් තිබීම. කරත්ත රෝදයකට පට්ටම් සවි කිරීමේ දී
පට්ටම් රත් කිරීම. බෝතලයක ලෝහ මූඩි රත්කර විට ගැලවීම පහසුවීම. 02

<u>**මුළු ලකුණු 11**</u>

05. (A) (i) A – තලබමරය B – මෝටරය C – බල්බය ( A හා B නිවැරදි නම්) 02

(ii) ශක්තිය 01

(iii) ධාන්‍ය ඇඹරීම, ලී මෝල් ක්‍රියාකරවීම, ද්‍රව්‍ය ප්‍රවාහනය වැනි සුදුසු පිළිතුරු දෙකක් 02

(B) (i) සුදුසු ප්‍රයෝජන දෙකක් 02

(ii) ආලෝක කිරණ රාශියක් එක් වීමෙන් ආලෝක කදම්බයක් සෑදේ. 01

(iii) අදීප්ත වස්තු 01

(iv) පාරදෘශ්‍ය - අවර්ණ පොලිතීන්
පාරභාසක - තෙල් කඩදාසි/ බොර ජපය / පාට වීදුරු 02

<u>**මුළු ලකුණු 11**</u>

06. (A) (i) යකඩ 01

(ii) ධ්‍රැව 01

(iii) උත්තර ධ්‍රැවය – A දක්ෂිණ ධ්‍රැවය – B 01

(iv)  02

(v) චුම්බක ක්ෂේත්‍රය 01

(B) (i) කම්පනය

(ii) ධ්වනි ප්‍රභව

(iii) කන

(iv) ඝෝෂ

(v) ඇසීම (ලකුණු 1×5=05)

<u>**මුළු ලකුණු 11**</u>